සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

# දෙවන වාර පරීක්ෂණය - 2025
## இரண்டாம் தவணைப் பரீட்சை - 2025/ Second Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය I,II

කාලය / நேரம் / Time } පැය තුනයි

නම / பெயர் / Name } ........................................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ........................................

| | |
|---|---|
| අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි | අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න |

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් භාවිතයෙන් සිසුන්ට හා පාසල් කළමණාකාරීත්වයට සැලසෙන වාසියක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
   (1) පාසල් පැවරුම් නිවසේදී ම නිම කර එසැණින්ම උඩුගත කිරීමට හැකි වීම, ගුණාත්මක ඉගෙනුම් ඒකක පද්ධතියට එක් කිරීමට හැකි වීම
   (2) පැවරුම් අධීක්ෂණය හා ප්‍රතිඵල දැක්වීම, තමන්ගේම කාල සටහනකට අනුව ඉගෙනීමට හැකි වීම
   (3) සංවාද මණ්ඩප හා සම්බන්ධ වීම මගින් ගැටලු ඉදිරිපත් කරමින් අදහස් දක්වමින් ඉගෙනීමට හැකි වීම, පාසල් පැවරුම් නිවසේදී ම නිමකර එසැණින් උඩුගත කිරීමට හැකි වීම
   (4) ශිෂ්‍ය හා ගුරු තොරතුරු පාසල් තොරතුරු කළමනාකරණය සහ යාවත්කාලීන කිරීමට පහසු වීම, වීඩියෝ දර්ශන මගින් විෂය සමගාමී ක්‍රියාකාරකම් වල නිරත වීමට හැකි වීම

2. පරිගණක පරම්පරා හා සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් නිදොස් වරණය වන්නේ කුමක් ද?
   (1) දෙවන පරම්පරාවේ පරිගණකවල ආචයනය කරන ලද ක්‍රමලේඛණ සංකල්පය භාවිතා කරයි.
   (2) පළමුවන පරම්පරාවේ පරිගණකවල උසස් මට්ටමේ ක්‍රමලේඛණ භාෂා භාවිතා කරයි
   (3) පස්වන පරම්පරාවේ පරිගණකවල වැඩිදියුණු වූ චිත්‍රක අතුරුමුහුණත් සහිත මෙහෙයුම් පද්ධති භාවිතා කරයි
   (4) හතරවන පරම්පරාවේ පරිගණකවල මෙහෙයුම් පද්ධති භාවිතය මුලින්ම ආරම්භ විය

3. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව එක් මසක් තුළ ලබාගත් කාලගුණ විද්‍යා හා සම්බන්ධ දත්ත හා තොරතුරු පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
   A - 20 $^0$C, 16 $^0$C, 15 $^0$C යනු නුවරඑළිය දිස්ත්‍රික්කයේ දින කිහිපයක උෂ්ණත්වය වේ.
   B - නුවරඑළිය දිස්ත්‍රික්කයේ සාමාන්‍ය මාසික උෂ්ණත්වය 14 $^0$C වේ.
   C - මෙම මස තුළ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඩුම උෂ්ණත්වය 10 $^0$C වේ.

   ඉහත ප්‍රකාශනයන්හි දත්ත සහ තොරතුරු නිවැරදිව වෙන් කර දක්වා ඇති වරණය කුමක් ද?
   (1) A දත්ත වන අතර B සහ C තොරතුරු වේ. (2) A තොරතුරක් වන අතර B සහ C දත්ත වේ.
   (3) A සහ C දත්ත වන අතර B තොරතුරක් වේ (4) B දත්තයක් වන අතර A සහ C යනු තොරතුරු වේ.

4. පහත සඳහන් පරිගණක උපාංග වලින් ආදාන උපාංගයක් සහ ප්‍රතිදාන උපාංගයක් පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
   (1) යතුරු පුවරුව, මූසිකය (2) මුද්‍රණ යන්ත්‍රය, ස්පර්ශ තිරය
   (3) ස්පර්ශ තිරය, යතුරු පුවරුව (4) යතුරුපුවරුව, මුද්‍රණ යන්ත්‍රය

5. ද්වීමය $110110_2$ යන සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව පහත පිළිතුරු අතරින් කුමක් වේද?
(1) 54 (2) 64 (3) 30 (4) 45

6. ෂඩ් දශමය $2E_{16}$ යන සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටමය සංඛ්‍යාව පහත පිළිතුරු අතරින් කුමක් ද?
(1) $64_8$ (2) $56_8$ (3) $46_8$ (4) $65_8$

7. $1011_X$ යන සංඛ්‍යාවේ X ලෙස දක්වා ඇත්තේ සංඛ්‍යා පද්ධතියේ පාදය වේ. මෙම සංඛ්‍යාව අයත්විය හැකි සංඛ්‍යා පද්ධති/ ය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
(1) ද්වීමය පමණි (2) ද්වීමය, දශමය සහ අෂ්ටමය පමණි
(3) දශමය පමණි (4) ද්වීමය, අෂ්ටමය, දශමය සහ ෂඩ්දශමය යන සියල්ල ම

8. පරිගණක නෂ්‍ය මතකයක් සහ නෂ්‍ය නොවන මතකයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
(1) සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) , රෙජිස්තර මතකය (Registers)
(2) රෙජිස්තර මතකය, පඨනමාත්‍ර මතකය (ROM)
(3) පඨනමාත්‍ර මතකය, වාරක මතකය (Cache)
(4) පඨනමාත්‍ර මතකය, රෙජිස්තර මතකය

9. පරිගණක ජාල ස්ථල විද්‍යා හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - ජාලයේ ඇති සෑම පරිගණකයක්ම ජාලයේ සෑම පරිගණකයක්ම හා සම්බන්ධ වේ
B - ප්‍රධාන කේබලයක් හරහා සියලුම සම්බන්ධතා ඇති කරමින් ජාලගත කරයි
C - එක් පරිගණකයක හෝ කේබලයක අක්‍රමිකතාවයක් හේතුවෙන් සම්පූර්ණ ජාලයම අක්‍රීය කරයි
ඉහත ලක්ෂණයන්ට ගැළපෙන ජාල ස්ථල නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
(1) දැල (Mesh), තරු (Star), මුදු (Ring) ආකාරයේ ජාල (2) රුක් (Tree), තරු, මුදු ආකාරයේ ජාල
(3) දැල් , බස් (Bus), මුදු ආකාරයේ ජාල (4) දැල් , රුක්, මුදු ආකාරයේ ජාල

10. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A- දැක්වීමේ උපක්‍රමයකි B- දත්ත ආදාන මෙන්ම ප්‍රතිදාන උපාංගයකි C- මෘදු පිටපතක් ප්‍රතිදානය කරයි
පිළිවෙලින් ඉහත ප්‍රකාශ හා සම්බන්ධවන නිවැරදි උපාංගය සහිත පිළිතුර වන්නේ කුමක් ද?
(1) යතුරු පුවරුව, මුද්‍රණ යන්ත්‍රය, පරිගණක තිරය (2) මූසිකය, ස්පර්ශ තිරය, පරිගණක තිරය
(3) වෙබ් කැමරාව, මූසිකය , යතුරු පුවරුව (4) මයික්‍රොෆෝනය, යතුරු පුවරුව, ස්පර්ශ සංවේදී තිරය

11. සට්ටනය වන මුද්‍රණ යන්ත්‍රයක් සහ සට්ටනය නොවන මුද්‍රණ යන්ත්‍රයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
(1) පේළි මුද්‍රකය (Line Printer), තිත් න්‍යාස මුද්‍රකය (Dot Matrix Printer)
(2) ලේසර් මුද්‍රකය (Laser Printer), තාප සංවේදී මුද්‍රකය (Thermal Printer)
(3) තිත් න්‍යාස මුද්‍රකය, ලේසර් මුද්‍රකය
(4) තාප සංවේදී මුද්‍රකය, තීන්ත විදුම් මුද්‍රකය (Ink Jet Printer)

12. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - තිත් න්‍යාස මුද්‍රකය පරිගණකයට සම්බන්ධ කරයි
B - පරිගණක ජාල ස්විචය පරිගණකයට සම්බන්ධ කරයි
C - පරිගණක තිරය පරිගණකයට සම්බන්ධ කරයි
ඉහත ප්‍රකාශ හා සම්බන්ධයෙන් පිළිවෙලින් වඩාත් ගැළපෙන කෙවෙනිය සහිත පිළිතුර කුමක් ද?
(1) සමාන්තර කෙවෙණිය, RJ45 කෙවෙණිය, VGA කෙවෙණිය
(2) PS/2 කෙවෙණිය, සමාන්තර කෙවෙණිය, ශ්‍රේණිගත කෙවෙණිය
(3) සමාන්තර කෙවෙණිය, HDMI කෙවෙණිය, PS/2 කෙවෙණිය
(4) VGA කෙවෙණිය, සමාන්තර කෙවෙණිය, ශ්‍රේණිගත කෙවෙණිය

13. දත්ත සම්ප්‍රේෂණ විධි හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - රූපවාහිනී විකාශනය ඒකපථ දත්ත සන්නිවේදනය සඳහා උදාහරණයක් වේ
B - වෝකි ටෝකි යන්ත්‍රය ද්විපථ සඳහා උදාහරණයක් වේ
C - දුරකථන සංවාද අර්ධ ද්විපථ සඳහා උදාහරණයක් වේ
(1) A සත්‍ය වන අතර B හා C අසත්‍ය වේ (3) A අසත්‍ය වන අතර B හා C සත්‍ය වේ
(2) A, B හා C යන සියල්ල ම සත්‍ය වේ (4) A, B හා C යන සියල්ල ම අසත්‍ය වේ

14. පරිගණක ජාල දෙකක් හෝ වැඩි ගණනක් එකිනෙක සම්බන්ධ කිරීමට භාවිතා කරන උපක්‍රමය වන්නේ කුමක් ද?

(1) ජාලකරණ ස්විචය (Network Switch) (2) ජාලකරණ නාභිය (Hub)

(3) ජාලකරණ මංහසුරුව (Router) (4) ගිනි පවුර (Firewall)

15. ජාලකරණයේ වාසියක් සහ අවාසියක් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) සම්පත් පොදුවේ පරිහරණය, දත්ත හා තොරතුරු වේගවත්ව හුවමාරු කිරීමට හැකි වීම

(2) සම්පත් පොදුවේ පරිහරණය, දත්ත සඳහා අඩු ආරක්ෂාව

(3) ජාල බිඳවැටීම්, වෛරස ව්‍යාප්ත වීම

(4) විද්‍යුත් තැපැල භාවිතය, මධ්‍යගත මෘදුකාංග පාලනය

16. පාසලේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිෂ්‍ය සමාජය වෙත පවරන ලද කාර්යයක් සඳහා අවශ්‍ය වන පහත සඳහන් ගොනු ආචනය කර රැගෙන යාම සඳහා ඔබට භාවිත කළ හැකි අඩුම ධාරිතාවය සහිත USB සැනෙලි ධාවකය පහත ඒවා අතරින් කුමක් ද?

Dance.mp4 (1.5 GB) Details.docx (1020 KB) search data.pdf (1000 MB) extra.txt (872 Bytes)

(1) 2 GB (2) 4 GB (3) 8GB (4) 16 GB

17. 8 GB මතක ධාරිතාවයට තුල්‍ය වන පිළිතුර පහත ඒවා අතරින් කුමක් ද?

(1) $2^{23}$ KB (2) 1024 x 1024 KB (3) $2^{33}$ Bytes (4) $2^{10}$ x $2^{10}$ x $2^{10}$ x 8 Bits

18. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - පරිගණකයක දත්ත තැන්පත් කිරීමේ දී භාවිත වන කුඩාම ඒකකය බිටුව (Bit) වේ

B - රෙජිස්තර මතකය (Registry memory) වඩා වේගවත්ම හා ආචයන ධාරිතාවය වැඩිම උපාංගය යි

C - සංචිත/නිහිත මතකය මධ්‍ය සැකසුම් ඒකක මතකය ලෙස ද හඳුන්වයි

පහත ප්‍රකාශ අතරින් **සාවද්‍ය** ප්‍රකාශය/ප්‍රකාශ සහිත පිළිතුර කුමක් ද?

(1) A හා B පමණි (2) B පමණි

(3) C පමණි (4) B හා C පමණි

19. BCD කේත ක්‍රමයට අදාළව පහත දී ඇති ප්‍රකාශ සලකා බලන්න.

A - දශමය සංඛ්‍යා නිරූපණයට පමණක් භාවිත විය

B - එක් සංඛ්‍යාංකයක් බිටු තුනකින් නිරූපණය විය

C - 00111001 යන BCD කේතයට තුල්‍ය දශමය අගය 39 වේ

නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?

(1) A සහ B පමණක් නිවැරදි වේ (2) A සහ C පමණක් නිවැරදි වේ

(3) B සහ C පමණක් නිවැරදි වේ (4) A සහ C යන සියල්ල ම නිවැරදි වේ

20. OR තාර්කික ද්වාරයට අදාළ පරිපථ සංකේතය කුමක් ද?




21. ජනප්‍රිය සංගීත වැඩසටහනක එක් වටයක සිට ඊළඟ වටයට තේරී පත්වීම සඳහා විනිශ්චයකරුවන්ගේ කැමැත්ත (A) සහ sms මනාප (B) යන දෙකම අනිවාර්ය වේ. ඉහත සිද්ධියට අදාළ බූලීය ප්‍රකාශය වනුයේ පහත කුමක් ද?

(1) A AND B (2) A OR B (3) NOT (A AND B) (4) NOT (A OR B)

22. පහත දැක්වෙන තාර්කික පරිපථය සඳහා අදාළ වන බූලීය ප්‍රකාශය වනුයේ කුමක් ද?




(1) $\overline{(X.Y).Y}$

(2) $X + Y + Y$

(3) $X.Y.\overline{Y}$

(4) $\overline{X + Y + Y}$

23. පහත දැක්වෙන තාර්කික පරිපථයේ P සඳහා 0 ද Q සඳහා 1 ද ලබා දුන් විට ප්‍රතිදානය වනුයේ කුමක් ද?




(1) 1
(2) Q
(3) $\bar{P}$
(4) 0

24. පහත එක් එක් ප්‍රකාශ සලකන්න.

A - OR තාර්කික ද්වාරයෙහි එක් ආදානයක් හෝ බිංදුව වූ විට ප්‍රතිදානය බිංදුව විය යුතුය
B - AND තාර්කික ද්වාරයෙහි ආදානයන් සියල්ලම 0 වූ අවස්ථාවේ දී ප්‍රතිදානය 0 වේ
C - NOT තාර්කික ද්වාරයෙහි ප්‍රතිදානය සඳහා ආදානයන්හි කිසිදු බලපෑමක් නොමැත

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) A පමණි (4) B පමණි

25. පහත දැක්වෙන තාර්කික පරිපථ අතුරින් ලබා දෙන ආදාන වලට සමාන ප්‍රතිදානයන් ලැබෙන්නේ කවර පරිපථවල ද?



X Y Z

(1) X සහ Y (2) X පමණි (3) Y පමණි (4) කිසිවක් නොවේ

26. තාර්කික ද්වාර සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතරින් **වැරදි** ප්‍රකාශය වනුයේ කුමක් ද?

(1) පරිගණකයක් සෑදී ඇත්තේ සංකීර්ණ සංඛ්‍යාංක පරිපථ රාශියක එකතුවකිනි
(2) ඉලෙක්ට්‍රොනික පරිපථවල මූලික තැනුම් ඒකකය තාර්කික ද්වාර වේ
(3) තාර්කික ද්වාරයක් ට්‍රාන්සිස්ටර්, ඩයෝඩ සහ ප්‍රතිරෝධ ආදී අංගවලින් සමන්විත වෙයි
(4) මධ්‍ය සැකසුම් ඒකකය සෑදී ඇත්තේ AND මූලික තාර්කික ද්වාර පමණක් සම්බන්ධ වී සෑදුණු පරිපථයකි

27. පරිගණකයේ ආරම්භක ක්‍රියාකාරීත්වයට අදාළ කරුණු අනුපිළිවෙළින් තොරව A සිට D දක්වා පහත දක්වා ඇති අතර ඒවා අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර පහත පිළිතුරු අතරින් කුමක් ද?

A - POST වැඩසටහන ධාවනය වේ
B - CPU මගින් BIOS ප්‍රවේශනය කරයි
C - මතකයට අනුව දෘඩාංග පරීක්ෂා කරයි
D - මෙහෙයුම් පද්ධතිය සසම්භාවී ප්‍රවේශ මතකයට ප්‍රවේශනය කර ගනියි

(1) A B C D (2) B A C D (3) C A D B (4) B A D C

28. පහත දැක්වෙන්නේ දෘඩාංග සහ මෘදුකාංග අතර සම්බන්ධතාව රූප සටහනකි. එහි A , B සහ C පිළිවෙළින් වනුයේ,




(1) දෘඩාංග, මෘදුකාංග, ජීවාංග
(2) යෙදුම් මෘදුකාංග, පද්ධති මෘදුකාංග, දෘඩාංග
(3) දෘඩාංග, යෙදුම් මෘදුකාංග, පද්ධති මෘදුකාංග
(4) දෘඩාංග, පද්ධති මෘදුකාංග, යෙදුම් මෘදුකාංග

29. පරිගණකයක දෘඪ තැටිය හැඩසවි (Format) ගැන්වූ පසු ප්‍රථමයෙන් පරිගණකයට ස්ථාපනය කළ යුතු මෘදුකාංගය වන්නේ පහත සඳහන් මෘදුකාංග අතරින් කුමක් ද?

(1) මෙහෙයුම් පද්ධතිය (2) වෙබ් අතිරික්සුව (3) ප්‍රති වෛරස මෘදුකාංග (4) Open office Writer

30. පහත දැක්වෙන මෘදුකාංග අතරින් භාෂා පරිවර්තක මෘදුකාංග පමණක් අඩංගු පිළිතුර වනුයේ කුමක් ද?

(1) එසෙම්බලර් (Assembler), අර්ථවිනයාසක (Interpreter), සම්පාදක (Compiler)
(2) ඇන්ඩ්‍රොයිඩ් (Android), වින්ඩෝස් (Windows), උබුන්ටු (Ubuntu)
(3) ඇන්ඩ්‍රොයිඩ්, අර්ථවිනයාසක, සම්පාදක
(4) ඇන්ඩ්‍රොයිඩ්, අර්ථවිනයාසක, ලිනක්ස් (Linux)

Past Papers Wiki

31. පරිගණකයකට අලුතින් සුපරික්ෂකයක් සම්බන්ධ කරන ලදී. එම උපාංගය නිසි පරිදි ක්‍රියාත්මක වීම සඳහා පරිගණකයේ ස්ථාපනය කළ යුතු විශේෂ මෘදුකාංගය කුමක් ද?
   (1) කාර්යය කළමණාකරු (Task Manager)
   (2) උපක්‍රම ධාවකය (Device Driver)
   (3) උපස්ථ මෘදුකාංග (Backup Software)
   (4) ප්‍රතිවෛරස මෘදුකාංග (Antivirus Software)

32. වදන් සැකසුම් මෘදුකාංග වල ලේඛන සැකසීමේ දී භාවිත කළ හැකි එකෙල්ල (Align) ආකාරයක් **නොවන** පිළිතුර කුමක් ද?
   (1) වමට එකෙල්ල කිරීම (Align Text Left)
   (2) මැදට එකෙල්ල කිරීම(Center)
   (3) ඉහලට එකෙල්ල කිරීම(Align Text To Top)
   (4) දෙකෙලවර සමාන්තර එකෙල්ල කිරීම (Justify)

33. මෙහෙයුම් පද්ධතියේ එක් කාර්යයක් ලෙස ගොනු කළමණාකරණය දැක්විය හැකිය. එහිදී සිදුවන කාර්යයක් වනුයේ කුමක් ද?
   (1) සකස් කරනු ලබන දත්ත ප්‍රතිදාන ඒකක වෙත යොමු කරන තෙක් රඳවා තබා ගැනීම
   (2) පරිගණකයට සම්බන්ධ කරනු ලබන උපාංග පාලනය කිරීම
   (3) අවශ්‍ය පරිදි ෆෝල්ඩර් සැකසීම සහ අනවශ්‍ය ඒවා මකා දැමීම
   (4) පරිගණකයේ සිදුවන සියලුම ක්‍රියාවලි සහ අවශ්‍ය සම්පත් කළමණාකරණය

34. පහත දැක්වෙන මෙහෙයුම් පද්ධතිවල නිවැරදි ගැළපුම වනුයේ කුමක් ද?

| | | | |
|---|---|---|---|
| A | Microsoft සමාගම | 1 | Ubuntu |
| B | Apple සමාගම | 2 | Mac OS |
| C | Google සමාගම | 3 | Android |
| D | Linux සමාගම | 4 | Windows |

   (1) A- 4, B-2, C-3, D-1
   (2) A-2, B-4, C-1, D-3
   (3) A-3, B-2, C-1, D-4
   (4) A-2, B-1, C-4, D-3

35. Save සහ Save as යන විධාන සම්බන්ධයෙන් පහත දක්වා ඇති ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
   (1) පළමු වතාවට ලේඛනයක් සුරැකීමේ දී Save සහ Save as යන විධාන භාවිත කළ හැක
   (2) සුරකින ලද ලේඛනයක් වෙනත් නමක් භාවිතයෙන් නැවත සුරැකීමේ දී Save as විධානය භාවිත කළ හැක
   (3) සුරකින ලද ලේඛනයක් එම නමින්ම නැවත නැවත සුරැකීමේ දී Save විධානය යොදා ගත හැක
   (4) Save සහ Save as විධානවල භාවිතය සමාන වේ

36. වදන් සැකසුම් ලේඛනයක දක්නට ලැබෙන මුද්‍රණ පෙර දසුනෙහි වැදගත්කම වඩාත් හොඳින් විදහා දක්වන පිළිතුර වනුයේ කුමක් ද?
   (1) ලේඛනයක් මුද්‍රණය කිරීමට පෙර එය පරිශීලකයාට දැක ගත හැකි වීමයි
   (2) දී ඇති උපදෙස්වලට අනුව ලේඛනය නියමිත පරිදි මුද්‍රණය වනවා ද නැද්ද යන්න මුද්‍රණයට පෙර පරීක්ෂා කළ හැකි වීමයි
   (3) මුද්‍රණය කිරීමට අදාල ලේඛනයක් සැකසීමේදී පිටු සීමා සකස් කර ගැනීමට හැකි වීමයි
   (4) ලේඛනය මුද්‍රණයට පෙර සෝදුපත් බැලීම සඳහා භාවිතයයි

37. වදන් සැකසුම් මෘදුකාංග සම්බන්ධයෙන් පහත A සහ B තීරු සසඳන්න.

| | A | | B |
|---|---|---|---|
| 1 | සිරස් (Portrait) සහ තිරස් (Landscape) | X | එකෙල්ල (Alignment) |
| 2 | බුලට් (Bullets),අංකන (Numbering), බහුමට්ටම් (Multilevel) | Y | දිශානතිය (Orientation) |
| 3 | වමෙන්, මැදින්, දකුණෙන් හා දෙකෙළවර සමාන්තර | Z | ලැයිස්තු (List) |

ඉහත වගුවේ A හා B තීරු නිවැරදිව ගැළපූ විට පිළිතුර වනුයේ,
   (1) 1- X, 2 - Y, 3 - Z
   (2) 1- Y, 2 - X, 3 - Z
   (3) 1- Z, 2 - Y, 3 - X
   (4) 1- Y, 2 - Z, 3 - X

38. වදන් සැකසුම් මෘදුකාංගවල භාවිතයන් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

X ලේඛන නිර්මාණයේ දී ඒවායේ විචිත්‍රවත් බව වැඩි කර ගැනීම සඳහා හැඩතල, චිත්‍රක, වගු, Word Art යනාදී අංග පහසුකම් සලසයි

Y ලේඛනයක අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ දෝෂ නිවැරදි කිරීම සඳහා ශබ්ද නිධිය (Thesaurus) භාවිතා කරයි

Z වදන් සැකසුම් මෘදුකාංගවල පමණක් තැපැල් මුසුව භාවිතය පහසුකම පවතී

ඉහත සඳහන් ප්‍රකාශ අතරින්

(1) X සහ Yපමණක් නිවැරදිය (2) Y පමණක් නිවැරදිය

(3) X හා Z පමණක් නිවැරදිය (4) සියල්ල නිවැරදියි

39. වදන් සැකසුම් මෘදුකාංග සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවරදි ප්‍රකාශය කුමක් ද?

(1) වදන් සැකසුම් ලේඛනයක් සැකසීමේ දී අන්තර්ජාල පහසුකම් තිබීම අනිවාර්ය වේ

(2) වදන් සැකසුම් ලේඛනක් .pdf ආකාරයට save කළ නොහැක

(3) වදන් සැකසුම් මෘදුකාංගවල විවිධ සංස්කරණයන් පවතින අතර නව සංස්කරණ භාවිතයට අන්තර්ජාල පහසුකම අනිවාර්යයෙන්ම තිබිය යුතුය

(4) වදන් සැකසුම් ලේඛනයක් බාහිර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා Password (මුරපද) යෙදිය හැක

40. වදන් සැකසුම් මෘදුකාංග භාවිතයෙන් සකස් කරන ලද ලේඛනයක **පේළි සහ ඡේද අතර පරතරය** සකස් කර ගැනීම සඳහා සහාය වන මෙවලම පහත ඒවා අතරින් කුමක් ද?

(1) 

(2) 

(3) 

(4) 

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025 / Second Term Test - 2025**

ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය

**තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය I,II**

නම / பெயர் / Name } ..............................................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....................................

## තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය II

- **පළමුවන** ප්‍රශ්නය හා තෝරා ගත් තවත් **ප්‍රශ්න හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ.

1. (i) පරිගණක මතක හා සම්බන්ධ A සිට D තෙක් ලේබල කරන ලද පහත වගන්ති වල සත්‍ය අසත්‍ය බව එක් එක් ලේබලය ඉදිරියෙන් පිළිවෙලින් √ හෝ X ලෙස ලකුණුකර පෙන්වන්න.

A - දෘඩ තැටිය (Hard Disk) නශ්‍ය නොවන මතකයකි.
B - සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) නශ්‍ය මතකයකි.
C - රෙජිස්තර මතකය (Registry memory) නශ්‍ය නොවන මතකයකි.
D - USB සැනෙළි ධාවකය නශ්‍ය මතකයකි.

(ii) පහත දී ඇති වගුවෙහි X තීරුවේ A සිට D දක්වා පරිගණක මෘදුකාංග කිහිපයක් ද Y තීරුවේ අංක 1 සිට 4 දක්වා උදාහරණ කිහිපයක් අනුපිළිවෙලින් තොරව දක්වා ඇත.

| X | | Y | |
|---|---|---|---|
| A | මෙහෙයුම් පද්ධතියකි | 1 | උබුන්ටු |
| B | යෙදුම් මෘදුකාංගයකි | 2 | ප්‍රතිවෛරස මෘදුකාංගයකි |
| C | උපයෝගීතා මෘදුකාංගයකි | 3 | Libre Office Writer |
| D | භාෂා පරිවර්තකයකි | 4 | සම්පාදකය |

X සහ Y තීරු ගළපා ලේබලය → අංකය ආකාරයෙන් ලියා දක්වන්න.

(iii) කේබල කෙළවරයන් හතරක් රූපය 1 හි A සිට D දක්වා ඇත.




රූපය 1

පහත දැක්වෙන ප්‍රකාශනයන්ට අදාළ ලේබලය → ලේබල අංකය ආකාරයෙන් ලියා දක්වන්න.

I - පරිගණකය පරිගණක ජාලයට සම්බන්ධ කිරීම
II - සංඛ්‍යාංක රූපවාහිනියක් පරිගණකයට සම්බන්ධ කිරීම
III - මූසිකය පරිගණකයට සම්බන්ධ කිරීම
IV - නවීන මුද්‍රණ යන්ත්‍රයක් පරිගණකයට සම්බන්ධ කිරීම

(iv) ඉංග්‍රීසි හෝඩියේ 'e' අක්ෂරයට හිමි දශමය අගය 101 නම් 'k' අක්ෂරයට හිමි ඇස්කි (ASCII) අගය ලියා දක්වන්න. (ගණනය කිරීම පෙන්වන්න)

(v) රූපය 2 හි ද්විමය සංඛ්‍යාවක් නිරූපණයට අදාළ ගණක රාමුවක් දක්වා ඇත. එහි දැක්වෙන අගයට තුල්‍ය අෂ්ටමය අගය ලබා ගන්න.




(vi) පහත සඳහන් ආචයන උපාංග දත්ත ප්‍රවේශ කර ගැනීමේ වේගය අනුව ආරෝහණ පටිපාටියට සකස් කරන්න.
(ලේබල මගින් පමණක් ඉදිරිපත් කරන්න. උදාහරණ: A – B – C...........ලෙස)

A - චුම්භක පටිය (Magnetic Tape)
B - සංචිත මතකය (Cache Memory)
C - සැනෙලි මතකය ( Pen Drive )
D - සසම්භාවී පිවිසුම් මතකය (RAM)
E - රෙජිස්තර මතකය (Memory Registers)

(vii) මෙහෙයුම් පද්ධතියේ කාර්යයක් ලෙස ගොනු කළමනාකරණය දැක්විය හැකිය. මෙහෙයුම් පද්ධතිය විසින් ගොනු කළමනාකරණය සඳහා සිදු කරනු ලබන සේවාවන් දෙකක් ලියන්න.

(viii) AND සහ OR ද්වාර භාවිතා කර පහත සඳහන් බූලීය ප්‍රකාශයට අදාළ තාර්කික පරිපථය අඳින්න.
Q=A.(B+C)

(ix) රූපය 3 හි දක්වා ඇති තාර්කික පරිපථය අනුව A, B සහ C ආදාන පිළිවෙලින් 1,1 සහ 0 වන්නේ නම් X සහ Y හි ප්‍රතිදානයන් පිළිවෙලින් ලියන්න.




(x) වදන් සැකසුම් මෘදුකාංග හා සම්බන්ධ පහත වගන්තිවල සත්‍ය අසත්‍ය බව එක් එක් ලේබලය ඉදිරියෙන් පිළිවෙලින් √ හෝ X ලෙස ලකුණුකර පෙන්වන්න.

A - ලේඛනයට වගු ඇතුළත් කළ හැකි වුවද චිත්‍රක ඇතුළු කිරීමට පහසුකම් නොමැත
B -  හැඩසවි පින්තාරු මෙවලම භාවිතයෙන් අකුරු හැඩය වැනි හැඩසවි පිටපත් කර වෙනත් පාඨවලට ඒවා යෙදීමට හැකිය.
C - සිරස් සහ තිරස් යනු වදන් සැකසුම් මෘදුකාංගයේ දී ලබාගත හැකි පිටු දිශානති වේ.
D - සෙවීම සහ ප්‍රතිස්ථාපනය භාවිතයෙන් මුද්‍රණ පෙරදසුන ලබාගත හැකිය.

2 (i) වෛද්‍ය පරීක්ෂණ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණය භාවිතා කරන අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ. ඒ සඳහා භාවිතා කළ හැකි යන්ත්‍රෝපකරණ වරහන තුළ දක්වා ඇත. ඒවාට අදාළවන කාර්යය සහ යන්ත්‍රෝපකරණය ගළපා ලේබල මගින් ලියා දක්වන්න.
කාර්යය:-

A - ශරීරයේ අභ්‍යන්තර කොටස් වෙන් වෙන් වශයෙන් ත්‍රිමාණ ලෙස රූපගත කිරීම
B - දෝංකාරය මගින් ශරීරයේ අභ්‍යන්තර කොටස්වල සවිස්තරාත්මක රූප සටහන් ලබා ගැනීම
C - හෘද ස්පන්දනය නිරීක්ෂණය කිරීම
D - මොලයේ ක්‍රියාකාරීත්වය සටහන් කිරීම

යන්ත්‍රෝපකරණ:-

| | | | |
|---|---|---|---|
| W- | විද්‍යුත් නිකර්පර රේඛණ යන්ත්‍රය (EEG) | X - | විද්‍යුත් තන්තු රේඛිය යන්ත්‍රය (ECG) |
| Y - | චුම්බක අනුනාද මූර්තන යන්ත්‍රය (MRI) | Z - | පරිගණක ආක්ෂක ශරීර ස්තර එක්ස්රේ යන්ත්‍රය (CAT) |

(ii) පහත දී ඇති වගුවෙහි X තීරුවේ පරිගණක පරම්පරා ද භාවිතා කරන ලද ප්‍රධාන දෘඩාංග තාක්ෂණයන් Y තීරුවේ ද දක්වා ඇත.

| X | | Y | |
|---|---|---|---|
| A | පළමුවන පරම්පරාව | 1 | ට්‍රාන්සිස්ටර (Transistors) |
| B | දෙවන පරම්පරාව | 2 | රික්තක නළ (Vacuum Tubes) |
| C | තෙවන පරම්පරාව | 3 | ක්ෂුද්‍ර සකසනය (Micro Processors) |
| D | හතරවන පරම්පරාව | 4 | අනුකලිත පරිපථ (Integrated circuits) |

ඉහත X සහ Y තීරු නිවැරදිව ගළපා පිළිතුරු ලේබල මගින් ඉදිරිපත් කරන්න.

(iii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අපගේ ජීවිතයේ සමීපතම මිතුරා වුව ද මෙහි අනිසි භාවිතයන් ද ඇත. එවැනි අනිසි භාවිතයන් දෙකක් ලියා දක්වන්න.

(iv) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ භාවිතා වන තොරතුරු තාක්ෂණ යෙදවුම් දෙකක් ලියා දක්වන්න.

(v) ව්‍යාපාර සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ව්‍යාපාර කටයුතු පහසුකරයි. විද්‍යුත් මාධ්‍ය සාකච්ඡා ඉන් එක් අවස්ථාවකි. මෙහි එක් වාසියක් සහ අවාසියක් ලියා දක්වන්න.

3. (i) ද්විතියික ආචයන උපාංග හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - නිසිඳු විසින් සකස් කරන ලද ඡායාරූපයේ මුද්‍රණ පිටපතක් ලබා ගැනීමට වෙනත් ස්ථානයකට රැගෙන යාම

B - ෂෙලිනි විසින් සකස් කරන ලද ගොනුව ආචයනය කිරීමට පරිගණකය තුළ ඇති ප්‍රධාන ආචයන උපක්‍රමය භාවිතා කරයි

C - හිරුෂ ඔහුගේ ඩිජිටල් කැමරාවේ ඇති මෙම උපක්‍රමයෙහි බොහෝ ඡායාරූප ආචයනය කර ඇත

D - ප්‍රධාන බැංකු කළමණාකරුවකු වන අයේෂ් ඔහුගේ සර්වර් පරිගණකයේ ඇති ගොනු මෙහි උපස්ථ කර ඇත

ඉහත ප්‍රකාශවලට ගැළපෙන ආචයන මාධ්‍ය හඳුනාගෙන ලේබල මගින් ලියා දක්වන්න.

W -දෘඪ තැටිය X-චුම්භක පටිය Y-USB සැනෙලි ධාවකය Z-මතක කාඩ්පත

(ii) ප්‍රධාන දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය දෙක නම් කර ඒ එක එකක් සඳහා උදාහරණය බැගින් ලියා දක්වන්න

(iii) දත්ත සම්ප්‍රේෂණ මාධ්‍යයක් ලෙස අධෝරක්ත කිරණ භාවිතා කරන අවස්ථා දෙකක් ලියා දක්වන්න.

(iv) පරිගණක ජාලකරණ උපාංග ලෙස භාවිතා කරන ජාලකරණ ස්විචය සහ ජාලකරණ නාභිය අතර වෙනස්කම් දෙකක් ලියා දක්වන්න.

(v) ප්‍රධාන පරිගණක ජාල වර්ග තුන ලියා දක්වන්න.

4. (i) වර්ණ ගැන්වීමක දී තෝරා ගත් වර්ණයක RGB (Red, Green, Blue) වලට හිමි දශමය අගයන් පිළිවෙලින් 214, 54 සහ 65 වේ . ඒ අනුව,

A - R වලට අදාළ ද්වීමය අගය ගණනය කරන්න

B - G වලට අදාළ අෂ්ටමය අගය ගණනය කරන්න

C - B වලට අදාළ ෂඩ්දශමය අගය ගණනය කරන්න

(ii) ෂඩ් දශමය සංඛ්‍යා පද්ධතියේ එක් භාවිතයක් ලියා දක්වන්න.

(iii) පරිගණකවල භාවිත වන පහත සඳහන් එක් එක් කේත ක්‍රම යොදා ගන්නා බිටු සංඛ්‍යාව ලියා දක්වන්න.

A- BCD B- EBCDIC C- ASCII D- UNICODE

(iv) පහත දැක්වෙන එක් එක් සංඛ්‍යාවල වැඩිම වෙසෙසි සංඛ්‍යාකය/බිටුව සහ අඩුම වෙසෙසි සංඛ්‍යාංකය/බිටුව ලියා දක්වන්න.

A- $73.0_8$ B- 0.032 C- $0.00101_2$ D- $EF4_{16}$

(v) පහත සඳහන් ප්‍රකාශවල සත්‍ය අසත්‍ය බව ලේබල ඉදිරියෙන් ලියා දක්වන්න.

A - නිබලයක් (Nibble) යනු බයිටයකින් (Byte) හරි අඩකි

B - එක් අක්ෂරයක බයිට එකක ධාරිතාවයක් ඇත

C - දත්ත මනින කුඩාම ඒකකය බයිටයයි (Byte)

D - කිලෝ බයිට 210 x 210 යන අගය ටෙරා බයිටයකට (TB) සමාන වේ

(5) (i) පහත දැක්වෙන තාර්කික පරිපථය සඳහා බූලීය ප්‍රකාශය සහ සත්‍යතා වගුව ගොඩනගන්න.




(ii) (a) $\overline{(A.A)}.(B+\bar{C})$ බූලීය ප්‍රකාශය සඳහා නිවැරදි ආදානයන් දක්වමින් NOR , AND සහ NOT තාර්කික ද්වාර පමණක් යොදා ගනිමින් සුදුසු පරිපථ සටහනක් ඇඳ දක්වන්න.

(b) ඉහත ඔබ අඳින ලද පරිපථ සටහන සඳහා සත්‍යතා වගුව ඇඳ දක්වන්න.

(iii) පහත දැක්වෙන වගුවේ A තීරුවේ අක්ෂරයට අදාළ B තීරුවේ අංකය නිවැරදිව ගළපන්න.

| A | | | B |
|---|---|---|---|
| A | OR | 1 | ආදානයන් සියල්ලම 1 වූ විට පමණක්ම ප්‍රතිදානය 1 වේ |
| B | AND | 2 | කිසිවිටකත් එකිනෙකට වෙනස් ආදාන 2ක් පැවතිය නොහැක |
| C | NOT | 3 | ආදානයන් පිළිවෙලින් 0,0 ලෙස ලබාදුන් විට ප්‍රතිදානය 1 වේ |
| D | NOR | 4 | ස්විච දෙකක් සමාන්තරගතව සම්බන්ධ කළ පරිපථයක ක්‍රියාවලියකට සමාන වේ |

6. (i) බුත්සදී විසින් නව පරිගණකයක් මිලදී ගැනීම සඳහා PC Shop නැමති ප්‍රසිද්ධ වෙළඳ සැලකට ගිය අතර එහිදී ඇයට අකිල නැමති වෙළඳසැල් සේවකයෙකු සහාය විය. අකිලගේ පහත යෝජනා වලට ඔබ එකඟ වේද? නොවේද? හේතු දක්වන්න.

(a) බලපත්‍ර සහිත මෙහෙයුම් පද්ධතිවලට වඩා බලපත්‍ර රහිත මෙහෙයුම් පද්ධති වඩාත් සුදුසු බව

(b) 1 TB දෘඩ තැටිය පංගු කිහිපයකට බෙදා භාවිතා කිරීම වඩා යෝග්‍ය බව

(ii) මෙහෙයුම් පද්ධතියක් මගින් ගොනුවක් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන කරුණු තුනක් ලියා දක්වන්න

(iii) විධාන පේළි අතුරුමුහුණත සහ චිත්‍රක පරිශීලක අතුරුමුහුණත අතර වෙනස්කම් දෙකක් සංසන්දනාත්මකව ලියා දක්වන්න.

(iv) පහත වරහන් තුළ දී ඇති මෙහෙයුම් පද්ධති මෘදුකාංග පහත වගුවෙහි සුදුසු පරිදි වර්ගීකරණය කර දක්වන්න.

පද ලැයිස්තුව : ( Linux, ATM යන්ත්‍රය, Mac OS, MS DOS, Ubuntu, Windows 7 )

| ඒක පරිශීලක | බහු පරිශීලක | බහු කාර්යය | තත්‍ය කාල |
|---|---|---|---|
| | | | |

ඉහත වගුව ඔබගේ පිළිතුරු පත්‍රයේ සටහන් කර පිළිතුරු සපයන්න.

(iv) පහත ගොනු වර්ග සඳහා අදාළ ගොනු දිගු/දිගුව ලියා දක්වන්න.

A - Word B - Excel C - Power Point D - Executable

PAST PAPERS WIKI



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

7. (i) පහත දැක්වෙනුයේ වදන් සැකසුම් මෘදුකාංගයක ඇති මෙවලම් තීරුවක (Tools bar) කොටසකි . ඒ ඇසුරින් පහත 1 රූපය 2 රූපයේ ආකාරයට හැඩගස්වා ගැනීම සඳහා භාවිත කළ හැකි මෙවලම් වල අංක ලියා දක්වන්න.




Artificial intelligence (AI) refers to the simulation of human intelligence in machines (device) that are programmed to think and learn like humans.

1 රූපය

**Artificial Intelligence (AI)** refers to the simulation of human intelligence in machines ~~(Device)~~ that are programmed to ***think and learn like humans***.

2 රූපය

(ii) වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් වලදී භාවිත වන කෙටිමං යතුර (Short cut Key) ලියන්න

A - යතුරු ලියනය කරන ලද ලේඛනයක ඡේදයක් දෙකෙළවර සමාන්තරව එකෙල්ල කිරීම

B - ලේඛනයේ ඇති යම් වචනයක් සොයා ඒ වෙනුවට වෙනත් වචනයක් ආදේශ කිරීම

C - ලේඛනයේ අන්තර්ගතයකට අධිසන්ධානයක් (Hyperlink) යෙදීම

D - සුරකින ලද ලේඛනයක් නැවත විවෘත කිරීම

පහත දැක්වෙනුයේ වදන් සැකසුම් මෘදුකාංගයක ඇති මෙවලම් (Tools) කිහිපයකි. ඒ ඇසුරින් ඇති (iii), (iv), (v), (vi) ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න




(iii) ඉහත මෙවලම් අතරින් 1 සහ 2 යන මෙවලම්වල භාවිතය ලියා දක්වන්න

(iv) පහත කාර්යයන් ඉටු කර ගැනීමට භාවිතා කළ හැකි මෙවලම් ලේබලය ලියා දක්වන්න.

(a) පාඨ (Text) සහිත කොටුවක් ලබා ගැනීමට

(b) ඡේදයක පළමු අකුර පේළි කිහිපයකට ඇඳ දැක්වීමට

(v) ඉහත මෙවලම් අතරින් 10 වන මෙවලම භාවිතය මගින් ඔබට ලබා ගත හැකි තොරතුරු දෙකක් ලියන්න

(vi) ලේඛනයක ඇති අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ දෝෂ සෙවීම සඳහා භාවිත කළ හැකි මෙවලම කුමක් ද?

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 10 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 150



Rs : 150



Rs : 150



Rs : 150



Rs : 150



Rs : 200



Rs : 300



Rs : 350



Rs : 300



Rs : 300



Rs : 150



Rs : 200



Rs : 150



Rs : 300



Rs : 300



Rs : 300

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180



Rs : 180

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE